PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

**තෙවන අන්තර්කාලීන වාර්තාව**

**2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම -2025 මැයි 06 වැනිදා**

නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (පැෆ්රල් සංවිධානය)

2025 මැයි 05

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම නිරීක්ෂණයට නිරීක්ෂකයින් 3000 ක්**

**පසුබිම**

ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු ගොඩනැගීමට ස්ථාපිත කරන ලද පළාත් පාලන ඡන්ද විමසීම 2025 මැයි මස 06 දින පැවැත්වීමට නියමිතය. සාමාන්‍යයෙන් වසර 4 කට වරක් පැවැත්විය යුතු වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම අවසන් වරට පවත්වන ලද්දේ 2018 වසරේදීය. ඒ අනුව මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පවත්වනු ලබන්නේ වසර 07 කට පසුව වීම විශේෂත්වයකි.

මෙවර පළාත් පාලන ඡන්ද විමසීම සඳහා දේශපාලන පක්ෂ 55ක් ඇප තැන්පත් කරන ලද නමුත් තරග බිමට පිවිස ඇත්තේ දේශපාලන පක්ෂ 49 කි. ඡන්ද විමසීම සඳහා දේශපාලන පක්ෂ විසින් නාමයෝජනා 2283 ක් ලබාදෙද්දී ස්වාධීන කණ්ඩායම් විසින් ලබාදී ඇති නාමයෝජනා ප්‍රමාණය 244 කි. කෙසේ නමුත් ජනතා කැමැත්තෙන් පළාත් පාලන ආයතන 339 නියෝජනය කිරීම සඳහා අපේක්ෂකයින් 75,589 ක් ඉදිරිපත්වී සිටී.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා ලියාපදිංචි වී ඇති ඡන්ද හිමියන් සංඛ්‍යාව 17,156,338 කි. වැඩිම ඡන්ද හිමියන් ප්‍රමාණය වන 1,896,304 ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම ඡන්ද හිමියන් ප්‍රමාණය වාර්තා වනුයේ මුලතිව් දිස්ත්‍රික්කයෙනි. එම ප්‍රමාණය 87,800 කි. තැපැල් ඡන්දහිමියන් ලෙස සුදුසුකම් ලැබූ සංඛ්‍යාව 648,494 කි.

## පැෆ්රල් සූදානම

**ඡන්ද විමසීම ප්‍රකාශයට පත්කල දින සිට දිගුකාලීන නිරීක්ෂකයින් 160 ක් විමසිල්ලෙන්**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ප්‍රකාශයට පත්කිරීමත් සමග පැෆ්රල් සංවිධානය සිය නිරීක්ෂණ කටයුතු ආරම්භ කළ අතර ඡන්ද ප්‍රදේශ 160 ආවරණය වන පරිදි පහසුවෙන් තොරතුරු කරා ප්‍රවේශ විය හැකි පලපුරුදු නිරීක්ෂකයින් 160ක් යෙදවීමට කටයුතු කරන ලදී. ඔවුන් හරහා නීති විරෝධී ප්‍රචාරක කටයුතු රාජ්‍ය දේපල අවභාවිතාවන් සහ වෙනත් මැතිවරණ වැරදි පිළිබඳව තොරතුරු වාර්ථා කර ගැනීමට පියවර ගන්නා ලද අතර ලැබුනු සමහර තොරතුරු වල නිරවද්‍යභාවය තහවුරු කර ගැනීමටද ඔවුන්ගේ සහයෝගය ලබාගන්නා ලදී. ඡන්ද විමසීම අවසන් සති දෙකක කාලයක් ගතවනතුරු දිගුකාලීන නිරීක්ෂකයින් සිය නිරීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදුකරනු ඇත.

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.

Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572

Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

## ඡන්ද විමසීම් දින ජංගම, ස්ථානගත සහ ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂකයින් හරහා ඡන්ද විමසීම නිරීක්ෂණයට පියවර

### ස්ථානගත නිරීක්ෂණය

මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පළාත් පාලන ආයතන 339 නියෝජනය වන පරිදි ඡන්ද මධ්‍යස්ථාන 13,759 ක් තුල පවත්වනු ලබන අතර පළාත් පාලන ඡන්ද විමසීමේ දක්නට ලැබෙන සුවිශේෂී ස්වභාවය වන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ සෑම ඡන්ද මධ්‍යස්ථානයකදීම ඡන්ද ගණන් කිරීම සහ අනෙකුත් සියලු දිස්ත්‍රික් වලදී අදාල කොට්ඨාශය තුළ තෝරාගත් එක් ස්ථානයකදී ඡන්ද ගණන් කිරීමට කටයුතු කිරීමය. ඒ අනුව පැෆ්රල් සංවිධානය මගින් ගණන් කිරීමේ මධ්‍යස්ථානද ආවරණය වන පරිදි ස්ථානගත නිරීක්ෂකයින් 2,300 ක් යෙදවීමට නියමිතය.

### ජංගම නිරීක්ෂණය

ස්ථානගත නිරීක්ෂකයින්ගෙන් ආවරණය නොවන ඡන්ද මධ්‍යස්ථාන ආවරණය කිරීමේ අරමුණින් යුතුව නිරීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයක් සහිත පලපුරුදු නිරීක්ෂකයින් එක් ජංගම රථයකට සිව් දෙනෙකු බැගින් වන ජංගම රථ 200ක් සඳහා ජංගම නිරීක්ෂකයින් 800 දෙනෙකු යෙදවීමට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කොට ඇත. ඔවුන් විසින් අතීතයේ ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් පිළිබඳව ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශ වලට වැඩි බරක් දෙමින් සිය නිරීක්ෂණ කටයුතු සිදුකරනු ඇත.

### පිළිගත් අනන්‍යතා ලේඛනයක් නොමැති කිසිවෙකුට ඡන්ද ප්‍රකාශය කිරීමට නොහැක

2025 මැයි මස 06 වන දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී සියලුම ඡන්ද හිමියන් සිය ඡන්දය ප්‍රකාශ කිරීමට යනවිට පසුගිය අවස්ථාවල මෙන්ම සිය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත් අනන්‍යතා ලේඛනයක් රැගෙන යන ලෙස සියලු ඡන්ද හිමියන්ගෙන් පැෆ්රල් සංවිධානය ඉල්ලා සිටී. මතු දැක්වෙන අනන්‍යතා ලේඛන ඡන්දය භාවිත කිරීම සඳහා වලංගු වන අතර පුද්ගලයා හඳුනාගත නොහැකි පරිදි ගැටලුවක් ඇත්නම් එවැනි අනන්‍යතා ලේඛන මෙන්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ආයතන මගින් නිකුත් කරඇති සේවා හැඳුනුම්පත් හෝ ජාතික හැඳුනුම්පත ඉල්ලුම් කිරීමේදී නිකුත් කරනු ලබන කුවිතාන්සිය හෝ ඡායාරූප සහිත හෝ රහිත වෙනත් ලේඛනයන් අනන්‍යතාවය තහවුරු කරගැනීම සඳහා පිලි නොගන්නා හෙයින් අනිවාර්යයෙන් මෙහි පහත සඳහන් ලේඛන වලින් එකක් රැගෙන යන ලෙස සියලු ඡන්දායකයින්ගෙන් අප ඉල්ලා සිටිමු.

**වලංගු අනන්‍යතා ලේඛන**

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත (පැරණි හෝ නව හැඳුනුම්පත)
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය
3. වලංගු රියදුරු බලපත්‍රය
4. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත (පැරණි හෝ නව ඊ - හැඳුනුම්පත)
5. වැඩිහිටි හැඳුනුම්පත (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිකුත් කළ)
6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන පූජ්‍ය/ පූජක හැඳුනුම්පත
7. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ජාතික හැඳුනුම්පත් තොරතුරු තහවුරු කිරීමේ ලිපිය
8. මැතිවරණ කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පත
9. මැතිවරණ කොමිෂන් සභාව විසින් පූර්ණ ආබාධ සහිත තැනැත්තන් සඳහා නිකුත් කර ඇති තාවකාලික හැඳුනුම්පත
10. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඡායාරූප සහිත තාවකාලික රියදුරු බලපත්‍රය

**ඔබේ ඡන්දය රටේ අනාගතය තීන්දු කරයි.**

සෑම ඡන්දයකටම ඇත්තේ සමාන වටිනාකමකි. ජනතා පරමාධිපත්‍යයේ මූලිකාංගයක් වන ඡන්ද අයිතිය ප්‍රකාශ කිරීම පුරවැසියන් සතු අයිතිවාසිකමක් සේම යුතුකමකි. ඔබ නිවැරදිව ඡන්දය ප්‍රකාශ කිරීම මගින් නිවැරදි පුද්ගලයින්ට ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියේ තීන්දු තීරණ ගැනීමට අවකාශය සැලසෙනවා සේම වැරදි පුද්ගලයින් පත්වීම වළක්වා ගැනීමටද හැකියාව ලැබෙනු ඇත. එම නිසා පිළිගත් අනන්‍යතා ලේඛන වලින් එකක් හෝ රැගෙන ඡන්ද විමසීම් දින උදෑසනින්ම ඡන්ද පොළට ගොස් ඔබේ වටිනා ඡන්දය ප්‍රකාශ කරන ලෙස ඔබේ අසල්වැසියන්ට, වෘත්තීය සගයින් උනන්දු කරවන ලෙස සියලු පුරවැසියන්ගෙන් ඉල්ලා සිටිමු. එය ඔබේ යුතුකමක් මෙන්ම පුරවැසි ඔබගේ වගකීමක් බව අප අවධාරණය කරමු.

**ඡන්දය ප්‍රකාශ කිරීමට සාධාරණ කාලසීමාවක් නිවාඩු ලබාදිය යුතුයි.**

රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා අවම පැය 2කට නොඅඩු කාලයක් මෙන්ම අවශ්‍ය යැයි හැඟෙන කාලසීමාවක් සඳහා වැටුප් අඩු කිරීමකින් තොරව නිවාඩු ලබාදිය යුතු බව රාජ්‍ය අංශ නිලධරයන්ගේ විශේෂ නිවාඩු පිළිබඳව ආයතන සංග්‍රහයේ xii වන පරිච්ඡේදයේ 12.3 ඡේදය උපුටා දක්වමින් මැතිවරණ කොමිසම නිවේදනයක් නිකුත් කර තිබේ.

එමෙන්ම පුද්ගලික අංශයේ සේවකයින්ටද ඡන්ද පාවිච්චි කිරීමට යාමට හා ඊමට නිවාඩු ලබාදීම සඳහා දුර හා කාලය පදනම් කරගනිමින් නිවේදනයක් නිකුත් කර ඇත. බොහෝ මැතිවරණ වලදී ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා යාමට සේවා යෝජකයන් විසින් නිවාඩු ලබා නොදෙන බවට නිරන්තරයෙන් පැමිණිලි ලැබෙන හෙයින් පුද්ගලික අංශ සේවායෝජකයින්ගෙන් අප ඉල්ලා සිටින්නේ මැතිවරණ කොමිසම නිකුත් කරන ලද චක්‍රලේඛනයට අනුව ලිඛිතව නිවාඩු ඉල්ලා සිටින පෞද්ගලික සේවකයන් හට සාධාරණ කාලසීමක් නිවාඩු ලබා දීමට කටයුතු කරන ලෙසයි. (නිවාඩු ලබාදීමට අදාල කාල රාමුව පහත වගුවේ දැක්වේ.)

| ඡන්දය පාවිච්චි කිරීම සඳහා සේවා ස්ථානයේ සිට තම ඡන්ද පොළට යා යුතු දුර ප්‍රමාණය | ලබාදිය යුතු අවම නිවාඩු කාලසීමාව |
|---|---|
| කි.මී. 40 ක් හෝ ඊට අඩුනම් | දින භාගයයි (1/2) |
| කි.මී. 40 ත් - 100 ත් අතර නම් | දින එකයි (1) |
| කි.මී. 100 ත් - 150 ත් අතර නම් | දින 1 1/2 |
| කි.මී. 150 ට වැඩිනම් | දින 2 |

## මනාප නොමැති සමානුපාතික මැතිවරණ ක්‍රමය

විවිධ මැතිවරණ වලදී ඡන්දය ප්‍රකාශ කරන ආකාරය විවිධ ස්වරූප ගනී. විශේෂයෙන්ම අවධානය යොමු කළ යුත්තේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී මනාප සළකුණු කිරීමක් සිදුනොවන අතර ඔබ කැමති දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම ඉදිරියේ x සළකුණු යෙදීමෙන් ඔබේ මහජන නියෝජිතයා තෝරාපත් කර ගැනීමට ඉඩප්‍රස්ථාව සැලසෙනු ඇති බවයි.

## නිහඬ කාලසීමාව තුළ ප්‍රචාරක කටයුතු තහනම්

ඡන්ද විමසීම පැය 48 කට පෙර එනම් 2025.05.03 දින මධ්‍යම රාත්‍රී 12 වන විට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා තරග වදින පක්ෂ කණ්ඩායම් සහ අපේක්ෂකයින් විසින් ඡන්ද විමසීමට අදාල සියලුම ප්‍රචාරක කටයුතු අවසන් කිරීම අනිවාර්යය අවශ්‍යතාවයකි.

කෙසේ නමුත් නිහඬ කාලසීමාවේ දෙවන දින මධ්‍යහ්න 12 වන විට පැමිණිලි 70 කට අධික ප්‍රමාණයක් අප වෙත වාර්තා වී තිබුනි. ඉන් බොහෝමයක් නීති විරෝධී ප්‍රචාරණ කටයුතු වලට අදාල ඒවාය. නිහඬ කාල සීමාවක් නම් කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ තරග කරනු ලබන අපේක්ෂකයින්, පක්ෂ සහ කණ්ඩායම් පිළිබඳව ගැඹුරින් සිතා බලා වඩා නිවැරදි තීන්දුවක් ගත හැකි වනු පරිදි නිරවුල් අවකාශයක් නිර්මාණය කිරීමටය. එවැනි තත්ත්වයක් තුළ ඡන්ද විමසීමේ ප්‍රචාරක කටයුතු අවසන් වන 2025.05.03 වන දින මොරටුව තෙලවල පැවති අවසන් ජන හමුව ආමන්ත්‍රණය කරමින් අග්‍රාමාත්‍ය හරිනි අමරසූරිය මෙනවිය කළ ප්‍රකාශය නොකළ යුතුව එකක් බව අපගේ හැඟීමයි. එකී ප්‍රකාශය මගින් නොනිල වශයෙන් පාක්ෂිකයන් පෙළඹවීමට දරන ලද උත්සහයක් බව අපගේ නිරීක්ෂණය වන අතර එය පසුගිය මැතිවරණ දෙකෙහිදී අප දුටු මැතිවරණ සංස්කෘතියේ සාධනීය වෙනසට හානිකර තත්ත්වයක් බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

## සමාජ මාධ්‍ය නිරීක්ෂණ ක්‍රියාවලිය - නිහඬ කාලසීමාවේ දෙවන දිනට පැමිණිලි 350 ඉක්මවයි.

මෙවර පළාත් පාලන ඡන්ද ආයතන විමසීමට අදාලව පැෆ්රල් සංවිධානය සිය සමාජ මාධ්‍ය නිරීක්ෂණ කටයුතු අප්‍රේල් මස 01 වනදා සිට ආරම්භ කල අතර සමස්ත පූර්ව මැතිවරණ සමයට අදාලව නිරීක්ෂණය වූ සිද්ධීන් 717 ක් ක් අප විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත. ඒ අතර දුස් තොරතුරු, වෛරීසහග ප්‍රකාශ, හිරිහැර කිරීමේ සිද්ධීන් හා ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ සිදුවීම්ද වෙයි. එමෙන්ම දුස්තොරතුරු සම්බන්ධ සිද්ධීන් පමණක් 53 ක් සෘජුවම පූර්ව මැතිවරණ කාලය තුළ සමාජ මාධ්‍ය ජාල වෙත වාර්තා කිරීමටද කටයුතු කර ඇත.

එමෙන්ම නිහඬ කාලසීමාවේ දෙවන දිනය වන විට 2025.05.05 මධ්‍යහ්න 12 වන විට පැමිණිලි 350 කට අධික ප්‍රමාණයක් අප වෙත වාර්තා වී ඇත.

## ආබාධ සහිත ඡන්දහිමියන් ඡන්ද විමසීම් ක්‍රියාවලියට අන්තකරණය කිරීම සඳහා පහසුකම් සැලසීම.

ආබාධ සහිත ඡන්දහිමියන් ඡන්ද විමසීම් ක්‍රියාවලියට අන්තර්කරන කිරීමේ අභිලාෂයෙන් පසුගිය කාල සීමාව තුළ ඉතා වැදගත් තීන්දු තීරණ රැසක් ගන්නා ලදී. එකී ක්‍රියාමාර්ග අතර ආබාධ සහිත පුද්ගලයන් සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමේදී විශේෂ හැඳුනුම්පතක් සකස් කිරීම. පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධ සහිත ඡන්ද හිමියන්ට තනිවම ඡන්දය සළකුණු කිරීම සඳහා "ඡන්ද පත්‍රිකාව මගපෙන්වන ස්පර්ශක රාමු" (Tactile Stencil Frame) සෑම ඡන්ද මධ්‍යස්ථානයකම භාවිතා කිරීමට පහසුකම් සළසා දෙන ලද අතර ස්පර්ශක රාමුව භාවිතා කරමින් දෘෂ්‍යාබාධිත තැනැත්තන්ට තමන් විසින්ම ඡන්දය භාවිතා කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසීම, ඡන්ද පෙට්ටිය ස්ථානගත කරනු ලබන මේසය රෝදපුටු භාවිතා කරන තැනැත්තන්ට හා මිහිමිත් ප්‍රජාවට පහසුවෙන් ලඟා විය හැකිවනසේ සහ ඡන්ද පත්‍රිකාව බහාලීමට හැකිවන සේ උස අඩු වන සේ ඡන්ද පෙට්ටිය ස්ථානගත කිරීම වැනි ක්‍රියාමාර්ග හඳුන්වා දිය හැක.

එමෙන්ම ඡන්ද මධ්‍යස්ථානයේ ඇතුල් වන ස්ථානයේ සිට ඡන්ද විමසීම පවත්වන ශාලාව වෙත මීටර් 100 හෝ වැඩි දුරක් පයින් ගමන් කිරීමට සිදුවන අවස්ථා වලදී යම් කිසි කායික අපහසුතාවයක් ඇවිදීමේ අපහසුතාවය නිසා පයින් යාම් ඊම් කිරීමට නොහැකි තැනැත්තෙකුට ඡන්ද මධ්‍යස්ථානය පිහිටි භූමියේ ප්‍රධාන පිවිසුම් දොරටුවේ සිට ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල දක්වා ත්‍රීරෝද රථ මගින් නොමිලේ ප්‍රවාහන පහසුකම් සලසා ඇත. විශේෂයෙන්ම මෙවර අර්ධ දෘෂ්‍යාබාධ තැනැත්තන් සඳහා අකුරු විශාලනය කර පෙන්වීමේ උපකරණ (අත්කාච විශේෂ උපැස් යුවල වැනි පෞද්ගලිකව භාවිතා කරන දෑ) විශේෂ අවසරයකින් තොරව ඡන්ද මධ්‍යස්ථානයට රැගෙන ආ හැකි බවත් එම උපකරණ භාවිතා කරමින් නිවැරදිව ඡන්ද භාවිතා කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසීම මෙවර සිදුවූ කැපී පෙනෙන වෙනසක් බව සඳහන් කළ හැකිය.

ආබාධ සහිත පුරවැසියන් අන් අය හා සමාන හා සාධාරණ පදනමකින් මැතිවරණ ක්‍රියාවලිය තුළට අන්තර්කරණය කර ගැනීම හා ඔවුන්ගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් මැතිවරණ කොමිසම ගන්නා ලද ඉදිරිගාමී පියවරයන් පිළිබඳව පැෆ්රල් සංවිධානයේ විශේෂ ස්තුතිය පළ කර සිටිමු.

## මැතිවරණ පැමිණිලි

නාමයෝජනා භාරගැනීම ආරම්භ කළ 2025 මාර්තු 20 වැනි දින සිට මැයි03 දින මධ්‍යම රාත්‍රිය දක්වා කාලය තුල (පූර්ව මැතිවරණ කාලය තුල) පැෆ්රල් සංවිධානයට සිදුවීම් 541 ක් වාර්තා වී ඇත. එම පැමිණිලි අතර නීති උල්ලංඝනයන් 553 සිදුවී ඇති අතර ඉන් 395ක් තහවුරු කර ඇත.

දේශපාලන අරමුණු ඇතිව සංග්‍රහ කිරීමේ සිද්ධීන් 57 ක් මෙම කාලය තුල වාර්තා වී ඇති අතර, ඉන් 33 ක් තහවුරුකොට ගෙන ඇත.  මේ අතරින් වියළි සලාක බෙදීම, සුවඳ විලවුන්, කෘෂි උපකරණ, පැළ වර්ග බෙදාදීම, ආධාර සඳහා අයදුම් පත්‍ර බෙදීම මෙන්ම සිංහල හින්දු අවුරුදු උත්සවවලට ආධාර කිරීමද ඇතුළත් වේ.

වාර්තා වූ පැමිණිලි අතරින්, ප්‍රචණ්ඩ ක්‍රියා 25 තහවුරු වී ඇති අතර, ඒ අතරින් පහරදීම් 06ක්, බෝම්බ ප්‍රහාර 01ක්, නිශ්චල දේපල වලට හානි කිරීම්, තර්ජනය කිරීම් හා බියවැද්දවීම් 07ක්, දේශපාලන පක්ෂ කාර්යාලවලට පහරදීම් 06ක් වාර්තා වේ.

රාජ්‍ය බලය, දේපළ සහ නිලධාරීන් අවභාවිතාව පිළබඳව පැමිණිලි 38ක් වාර්ථා වී ඇති අතර, ඉන් 19 ක් තහවුරු වී ඇත. ඒ යටතේ රජයේ සහනාධාර දීමනා දේශපාලන අර්ථයෙන් ලබාදීම, රාජ්‍ය නිලධාරීන් මාරු කිරීම හා රාජ්‍ය සංවර්ධන ව්‍යාපෘතීන් දේශපාලන ප්‍රවර්ධනය සඳහා භාවිතා කිරීම් වේ. එහෙත් සිදුවීම් වල ස්වභාවය හා ප්‍රමාණය සැසඳීමේදී එය එතරම් බරපතල තත්ත්වයක් ලෙස නිරීක්ෂණය නොවේ. කෙසේවුවද, ජනාධිපතිවරයාගේ ප්‍රකාශ හරහා පොදුවේ ඡන්දදායකයාට වන බලපෑම නොසළකා හැරිය නොහැක. එහෙත් එය පෙර පැවති මැතිවරණවලදී රාජ්‍ය බලය හා දේපළ අවභාවිතාව සැලකීමේදී තවමත් යහපත් තත්ත්වයකි.

## පැමිණිලි සාරාංශය

## පූර්ව මැතිවරණ කාල සීමාවට අදාල පැමිණිලි සාරාංශය

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 - පූවර් මැතිවරණ කාලය
අදාල සිද්ධි වල මැතිවරණ නීති උල්ලංඝනයන් (දීප ව්‍යාප්තව)
2025-03-20T14:00 - 2025-05-03T23:59

PAFFREL

| කාණ්ඩය | සිද්ධින් වලට මැතිවරණ/අනෙකුත් නීති උල්ලංඝනයන් | තහවුරු කල | තහවුරු නොකල | එකතුව |
|---|---|---|---|---|
| 1 | 1 - මනුෂ්‍ය ඝාතන | 1 | 0 | 1 |
| 2 | 2 - බරපතළ පහරදීම් | 0 | 0 | 0 |
| 3 | 3 - පහරදීම් | 5 | 1 | 6 |
| 4 | 4 - පැහැරගෙන යාම් | 0 | 0 | 0 |
| 5 | 5 - බෝම්බ ප්‍රහාර | 1 | 0 | 1 |
| 6 | 6 - වෙඩි තැබීම් | 0 | 0 | 0 |
| 7 | 7 - ගිනි අවි භාවිත කර තර්ජනය කිරීම | 0 | 0 | 0 |
| 8 | 8 - නිශ්චල දේපළ හානි කිරීම | 1 | 0 | 1 |
| 9 | 9 - චංචල දේපල හානි කිරීම | 0 | 1 | 1 |
| 10 | 10 - තර්ජනය කිරීම හා බිය වැද්දීම | 7 | 2 | 9 |
| 11 | 11 - දේශපාලන පක්ෂ කාර්යාල හානි කිරීම් | 6 | 0 | 6 |
| # | **ප්‍රචණ්ඩ ක්‍රියා වල එකතුව** | **21** | **4** | **25** |
| 12 | 12 - රාජ්‍ය බලය සහ දේපල අයුතු ලෙස භාවිතය | 10 | 6 | 16 |
| 13 | 13 - රජයේ වාහන මැතිවරණ කටයුතු සඳහා භාවිත කිරීම | 1 | 2 | 3 |
| 14 | 14 - රාජ්‍ය නිළධාරින්ට බලපෑම් කිරීම | 2 | 0 | 2 |
| 15 | 15 - රාජ්‍ය නිළධාරීන් පත් කිරීම මාරු කිරීම උසස් කිරීම | 2 | 6 | 8 |
| 16 | 16 - රාජ්‍ය නිළධාරින් සහ ආරක්ෂක අංශ දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම | 0 | 3 | 3 |
| 16-1 | 16-1 රජයෙන් ලබාදෙන දීමනා ආධාර ද්‍රව්‍ය දේශපාලනික අර්ථයෙන් ලබාදීම | 4 | 2 | 6 |
| # | **රාජ්‍ය බලය දේපළ නිළධාරීන් අයුතු ලෙස භාවිත කිරීම් වල එකතුව** | **19** | **19** | **38** |
| 17 | 17 - කටවුට් සැරසිලි කඩා දැමීම හා ගිනිබත් කිරීම | 5 | 0 | 5 |
| 18 | 18 - දේශපාලන කටයුතු වලට බාධා පැමිණ වීම | 0 | 0 | 0 |
| 19 | 19 - නීති විරෝධී ප්‍රචාරණ කටයුතු | 279 | 49 | 328 |
| 20 | 20 - නිරීක්ෂකයන්ට තර්ජනය කිරීම් හා බාධා කිරීම | 0 | 0 | 0 |
| 21 | 21 - රාජ්‍ය නිලධාරීන් පක්ෂග්‍රාහී ලෙස කටයුතු කිරීම සහ රාජකාරිය පැහැර හැරීම | 1 | 2 | 3 |
| 22 | 22 - නීති විරෝධී රැස්වීම් හා පෙළපාලි | 5 | 0 | 5 |
| 23 | 23 - නීති විරෝධී පක්ෂ කාර්යාල පවත්වාගෙන යාම | 35 | 6 | 41 |
| 24 | 24 - දේශපාලන අරමුණු ඇතිව සංග්‍රහ කිරීම | 33 | 24 | 57 |
| 25 | 25 - අංක තහඩු නොමැති වාහන භාවිතය | 0 | 0 | 0 |
| 26 | 26 - ජනමාධ්‍ය පක්ෂග්‍රාහී සහ අයථා ලෙස භාවිතය | 0 | 0 | 0 |
| 27 | 27 - ආරක්ෂක අංශ හෝ රාජ්‍ය නිළධාරීන් විසින් සිදු කරන බලපෑම් | 0 | 0 | 0 |
| 28 | 28 - අසත්‍ය ප්‍රචාර පැතිරවීම | 2 | 2 | 4 |
| 29 | 29 - මහජනතාවට පීඩනය වන සහ බාධා වන අයුරින් මැතිවරණ කටයුතු සිදු කිරීම සහ බලපෑම් කිරීම | 3 | 0 | 3 |
| 30 | 30 - ඡන්ද දායකයින්ට බලපෑම් කිරීම | 4 | 1 | 5 |
| 31 | 31 - ඡන්ද කාඩ් සම්බන්ධ වැරදි | 1 | 0 | 1 |
| 32 | 32 - ඡන්ද දායකයන් ප්‍රවාහනය කිරීම | 0 | 0 | 0 |
| 33 | 33 - ඡන්ද දායකයන්ට සංග්‍රහ කිරීම | 3 | 1 | 4 |
| 34 | 34 - ඡන්දපොළ නිළධාරීන්ට සහ කටයුතුවලට බාධා කිරීම | 0 | 0 | 0 |
| 35 | 35 - ඡන්ද දායකයන්ට පහරදීම/පලවා හැරීම | 0 | 0 | 0 |
| 36 | 36 - හොර ඡන්ද දැමීම සහ එයට උත්සහ කිරීම | 0 | 0 | 0 |
| 37 | 37 - වෙනත් සිදුවීම් | 24 | 10 | 34 |
| # | **අනෙකුත් මැතිවරණ නීති උල්ලංඝනයන් වල එකතුව** | **395** | **95** | **490** |
| | මුළු එකතුව | 435 | 118 | 553 |

* සඳහන් කර ඇති කාල පරාසය තුල අප වෙත සිද්ධි 541 ක් ද, මැතිවරණ/අනෙකුත් නීති උල්ලංඝනයන් 553 ක් ද වාතර්‍ා වී ඇත. (එක් සිද්ධියක් තුළ මැතිවරණ නීති උල්ලංඝනයන් කිහිපයක් තිබිය හැක)

## නිහඬ කාලසීමාවට අදාල මැතිවරණ පැමිණිලි සාරාංශය

PAFFREL

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 - නිහඬ කාලය
අදාල සිද්ධි වල මැතිවරණ නීති උල්ලංඝනයන් (දීප ව්‍යාප්තව)
2025-05-04T00:00 - 2025-05-05T10:00

| කාණ්ඩය | සිද්ධීන් වලට මැතිවරණ/අනෙකුත් නීති උල්ලංඝනයන් | තහවුරු කල | තහවුරු නොකල | එකතුව |
|---|---|---|---|---|
| 1 | 1 - මනුෂ්‍ය ඝාතන | 0 | 0 | 0 |
| 2 | 2 - බරපතළ පහරදීම් | 0 | 0 | 0 |
| 3 | 3 - පහරදීම් | 0 | 0 | 0 |
| 4 | 4 - පැහැරගෙන යාම් | 0 | 0 | 0 |
| 5 | 5 - බෝම්බ ප්‍රහාර | 0 | 0 | 0 |
| 6 | 6 - වෙඩි තැබීම් | 1 | 0 | 1 |
| 7 | 7 - ගිනි අවි භාවිත කර තර්ජනය කිරීම | 0 | 0 | 0 |
| 8 | 8 - නිශ්චල දේපළ හානි කිරීම | 0 | 0 | 0 |
| 9 | 9 - චංචල දේපල හානි කිරීම | 0 | 0 | 0 |
| 10 | 10 - තර්ජනය කිරීම හා බිය වැද්දීම | 0 | 0 | 0 |
| 11 | 11 - දේශපාලන පක්ෂ කාර්යාල හානි කිරීම් | 0 | 0 | 0 |
| # | **ප්‍රචණ්ඩ ක්‍රියා වල එකතුව** | **1** | **0** | **1** |
| 12 | 12 - රාජ්‍ය බලය සහ දේපල අයුතු ලෙස භාවිතය | 0 | 0 | 0 |
| 13 | 13 - රජයේ වාහන මැතිවරණ කටයුතු සඳහා භාවිත කිරීම | 0 | 0 | 0 |
| 14 | 14 - රාජ්‍ය නිළධාරින්ට බලපෑම් කිරීම | 0 | 0 | 0 |
| 15 | 15 - රාජ්‍ය නිළධාරීන් පත් කිරීම මාරු කිරීම උසස් කිරීම | 0 | 0 | 0 |
| 16 | 16 - රාජ්‍ය නිළධාරින් සහ ආරක්ෂක අංශ දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම | 0 | 0 | 0 |
| 16-1 | 16-1 රජයෙන් ලබාදෙන දීමනා ආධාර ද්‍රව්‍ය දේශපාලනික අපේක්ෂයෙන් ලබාදීම | 0 | 0 | 0 |
| # | **රාජ්‍ය බලය දේපළ නිළධාරීන් අයුතු ලෙස භාවිත කිරීම් වල එකතුව** | **0** | **0** | **0** |
| 17 | 17 - කටවුට් සැරසිලි කඩා දැමීම හා ගිනිබත් කිරීම | 0 | 0 | 0 |
| 18 | 18 - දේශපාලන කටයුතු වලට බාධා පැමිණ වීම | 0 | 0 | 0 |
| 19 | 19 - නීති විරෝධී ප්‍රචාරණ කටයුතු | 21 | 10 | 31 |
| 20 | 20 - නිරීක්ෂකයන්ට තර්ජනය කිරීම් හා බාධා කිරීම | 0 | 0 | 0 |
| 21 | 21 - රාජ්‍ය නිලධාරීන් පක්ෂග්‍රාහී ලෙස කටයුතු කිරීම සහ රාජකාරිය පැහැර හැරීම | 0 | 0 | 0 |
| 22 | 22 - නීති විරෝධී රැස්වීම් හා පෙළපාලි | 0 | 0 | 0 |
| 23 | 23 - නීති විරෝධී පක්ෂ කාර්යාල පවත්වාගෙන යාම | 8 | 5 | 13 |
| 24 | 24 - දේශපාලන අරමුණු ඇතිව සංග්‍රහ කිරීම | 1 | 1 | 2 |
| 25 | 25 - අංක තහඩු නොමැති වාහන භාවිතය | 0 | 0 | 0 |
| 26 | 26 - ජනමාධ්‍ය පක්ෂග්‍රාහී සහ අයථා ලෙස භාවිතය | 0 | 0 | 0 |
| 27 | 27 - ආරක්ෂක අංශ හෝ රාජ්‍ය නිළධාරීන් විසින් සිදු කරන බලපෑම් | 0 | 0 | 0 |
| 28 | 28 - අසත්‍ය ප්‍රචාර පැතිරවීම | 0 | 0 | 0 |
| 29 | 29 - මහජනතාවට පීඩනය වන සහ බාධා වන අයුරින් මැතිවරණ කටයුතු සිදු කිරීම සහ බලපෑම් කිරීම | 0 | 0 | 0 |
| 30 | 30 - ඡන්ද දායකයින්ට බලපෑම් කිරීම | 0 | 0 | 0 |
| 31 | 31 - ඡන්ද කාඩ් සම්බන්ධ වැරදි | 0 | 0 | 0 |
| 32 | 32 - ඡන්ද දායකයන් ප්‍රවාහනය කිරීම | 0 | 0 | 0 |
| 33 | 33 - ඡන්ද දායකයන්ට සංග්‍රහ කිරීම | 0 | 0 | 0 |
| 34 | 34 - ඡන්දපොළ නිළධාරින්ට සහ කටයුතුවලට බාධා කිරීම | 0 | 0 | 0 |
| 35 | 35 - ඡන්ද දායකයන්ට පහරදීම/පලවා හැරීම | 0 | 0 | 0 |
| 36 | 36 - හොර ඡන්ද දැමීම සහ එයට උත්සහ කිරීම | 0 | 0 | 0 |
| 37 | 37 - වෙනත් සිදුවීම් | 6 | 0 | 6 |
| # | **අනෙකුත් මැතිවරණ නීති උල්ලංඝනයන් වල එකතුව** | **36** | **16** | **52** |
| | මුළු එකතුව | 37 | 16 | 53 |

* සඳහන් කර ඇති කාල පරාසය තුල අප වෙත සිද්ධි 42 ක් ද, මැතිවරණ/අනෙකුත් නීති උල්ලංඝනයන් 53 ක් ද වාතර්ා වී ඇත. (එක් සිද්ධියක් තුළ මැතිවරණ නීති උල්ලංඝනයන් කිහිපයක් තිබිය හැක)

## ඡන්දය භාවිතා කර කඩිනමින් නිවෙස් කරා යන්න

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව අතර මග රැඳී නොසිට නිවෙස් කරා යන ලෙසත් කවර හෝ පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමකගේ උසිගැන්වීමක් අනුව ගැටුම්කාරී තත්ත්වයන්ට මැදිහත් නොවන ලෙසත් සහ වගකීම් සහගත සවිඥානික පුරවැසියෙකු ලෙස ඔබගේ පුරවැසි වගකීම ඉටු කරන ලෙසත් සෑම ඡන්දහිමියෙකුගෙන් ඉමහත් ඕනෑකමින් යුතුව ඉල්ලා සිටිමු.